සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/04/ Circular - 2016
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2016.04.11

දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/05

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ,
අනුරාධපුරය/ත්‍රිකුණාමලය/මුලතිව්/කුරුණෑගල/අම්පාර/
වව්නියාව/පොළොන්නරුව/පුත්තලම.

## ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ වස විස නැති දේශීය වී අස්වනු මිලදී ගැනීම හා අලෙවිය

### 1. හැදින්වීම

ආහාර සුරක්ෂිතතාව පිළිබඳ රජයේ ප්‍රමුඛ සමාජ සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනක් වන වස විස නැති ආහාර නිෂ්පාදනයට විශේෂ අවධානයක් යොමු කර තුන් අවුරුදු මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහනක් ආරම්භ කර ඇත. ජනාධිපති ලේකම් කාර්යාලයේ මඟ පෙන්වීම යටතේ ආරම්භක පියවරක් ලෙස 2015/2016 මහා කන්නයේදී රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තොරව අක්කර 15000 ක ගුණාත්මක භාවයකින් යුතු දේශීය වී වර්ග රැසක් වගා කොට ඇති අතර මේ වන විට එම වගාවන්හි අස්වනු නෙලීම ආරම්භ කොට ඇත. වස විසෙන් තොර දේශීය වී වගාව කෙරෙහි ගොවීන් යොමුකිරීම සහ එම නිෂ්පාදන මිලදී ගැනීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයා දිරිමත් වන පරිදි එම වී තොග මිලදී ගෙන සහල් බවට පත්කර එම නිෂ්පාදන මිලදී ගැනීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට වෙලඳපොලට නිකුත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුව ඇත.

අපේක්ෂිත ප්‍රතිලාභ

- වස විස නැති දේශිය වී වර්ග වගා කරන ගොවීන්ගේ අස්වැන්න සාධාරණ මිලකට අලෙවි වීම.
- පාරිභෝගිකයින්ට සාධාරණ මිලකට වස විසෙන් තොර දේශීය සහල් වර්ග මිලදී ගැනීමට අවස්ථාව උදාවීම.
- අඩු ආදායම්ලාභී (සමෘද්ධිලාභී) පවුල් සඳහා නව ආදායම් මාර්ග උත්පාදනය වීම. ( වී මිලදී ගැනීම/ වී සහල් බවට පත්කිරීම/සහල් ඇසුරුම් කිරීම/ සහල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදන ආදී ව්‍යාපාර)
- වස විසෙන් තොර සහල් ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන වෙළඳපොලට නිකුත් වීම.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
[redacted]2872202
Fax-011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
Fax-011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர் (நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax-011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
011-2887722(Hotline)

## 2. දැනට වාර්තාවී ඇති පරිදි දේශීය වී වගා කර ඇති ප්‍රදේශ

| දිස්ත්‍රික්කය | වගා කර ඇති භූමි ප්‍රමාණය (අක්.) | අපේක්ෂිත අස්වැන්න(කි. ග්‍රෑ.) | අලෙවියට ඉදිරිපත් වෙතැයි අපේක්ෂිත ප්‍රමාණය (කි. ග්‍රෑ.) |
|---|---:|---:|---:|
| අනුරාධපුරය | 2,649.1 | 2,649,100 | 500,000 |
| ත්‍රිකුණාමලය | 2094 | 2,094,000 | 500,000 |
| මුලතිව් | 1,050.3 | 1,050,300 | 200,000 |
| කුරුණෑගල | 1,004.49 | 1,004,490 | 500,000 |
| අම්පාර | 376.5 | 376,500 | 100,000 |
| වවුනියාව | 795.75 | 795,750 | 300,000 |
| පොළොන්නරුව | 444.38 | 444,380 | 100,000 |
| පුත්තලම | 650.5 | 650,500 | 500,000 |

වගා කර ඇති ස්ථාන හා ගොවීන් පිළිබඳ වැඩිදුර තොරතුරු දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගෙන් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගෙන් ලබාගත හැකිය.

## 3. ක්‍රියාත්මක ක්‍රමවේදය

### 3.1. ව්‍යවසායකයින් හඳුනා ගැනීම

**අදාල වී තොග මිලදී ගෙන සහල් බවට පත්කර වෙළඳපොලට නිකුත් කිරීමට තරම් ධාරිතාවක් ඇති,**ඉහළ මට්ටමට ව්‍යවසායකත්වය දියුණු කරගෙන ඇති දිවිනැගුම ප්‍රතිලාභීන් මේ සඳහා හඳුනාගත යුතුය. මෙහිදී දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් ඇතුළු අදාල අනෙකුත් ආයතන හා නිළධාරීන් සමඟ සාකච්ඡා කිරීම වැදගත් වනු ඇත.

ගබඩා පහසුකම් සහ වී මෝලක් හිමි අයෙකුවීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

### 3.2. ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීම, ණය අයකිරීම හා ගිණුම්තැබීම

**ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීම**

ගබඩා ආදී යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීමටත්, වී මිලදී ගැනීමටත්, සැකසුම් ක්‍රියාවලියටත් අවශ්‍ය විය හැකි අතිරේක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ජීවනෝපාය වක්‍රීය අරමුදලින් දැනට පවත්නා 5% පොලී ප්‍රතිශතය යටතේ ණය ලබාදිය යුතුය.

- මෙම වැඩසටහනට ක්ෂණික හා ප්‍රමුඛ අවධානය යොමු කලයුතු හෙයින් ප්‍රථමයෙන් ණය ලබාගෙන අඛණ්ඩව ගෙවමින් සිටින අයෙකුට ණය ශේෂයක් තිබුනා වුවද මෙම ව්‍යාපෘතිය සඳහා ණය නිදහස් කිරීමට එය බාධාවක් කර නොගත යුතුය.

- අවශ්‍යතාවය පරිදි රු 500,000/- ක් දක්වා ණය වරකදී හෝ කොටස් වශයෙන් හෝ ජීවනෝපාය වක්‍රීය අරමුදලෙන් ලබාදිය යුතුය.රු. 500,000 ඉක්මවා ණය අවශ්‍ය වුවහොත් ඒ සඳහා වන අදාල නිර්දේශ ලබාගෙන රු. 1000,000 දක්වා ණය සපයාදීම කෙරෙහි සලකා බැලීම අපේක්ෂා කෙරේ.

- මුලික වැටුපෙන් 40% ඉක්මවා ශුද්ධ වැටුපක් ලබන වසර 10 ක ස්ථිර රජයේ හෝ අර්ධ රාජ්‍යයක (සංස්ථා මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන ඇතුලත්ව) සේවයේ නියුතු එක් නිලධාරියෙකු හෝ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් දෙදෙනෙකුගේ ඇප මත හෝ දේපළ ඇපයක් මත ණය නිදහස් කල යුතු වේ. මෙහිදී ව්‍යවසායකයා සතු වී මෝල ඇතුළු දේපල ඇපයට තබාගැනීම වඩාත් යෝග්‍යවේ.

**ණය අයකිරීම.**

මිලදීගත් වී තොගයෙන් සහල් සකස් කර අලෙවි කරනු ලබන ප්‍රතිශතයට සාපේක්ෂ ප්‍රමාණයකින් ණය මුදල ගෙවා නිම කරනු ලබන පරිදි හෝ වාරික 60 ක උපරිමයකට යටත්ව හෝ යන දෙකෙන් වඩාත් සුදුසු ක්‍රමයට ණය අයකරගත යුතුවේ. යම් පුද්ගලයෙකු වසර 5 කට පෙර එකවර ණය ගෙවා අවසන් කරන්නේ නම් එදිනට පිටහිටි ශේෂයට පොළී අයකර ණය ගිණුම් අවසන් කල යුතුය.

- ගිණුම් තැබීම

**ණය නිදහස් කිරීමේ ගිණුම් සටහන**

ලැබිය යුතු ණය ගිණුම ජීවනෝපාය චක්‍රීය අරමුදලේ (කේත අංක 4041) - හර
සාමාජික තැන්පත් ගිණුම - බැර

**ණය අයකිරීමේ ගිණුම් සටහන**

ලැබිය යුතු ණය ගිණුම - ජීවනෝපාය චක්‍රීය අරමුදල් (වාරික මුදල) - බැර
ලද පොළී - දුන් ණය ගිණුම (පොළී මුදල) - බැර

## 3.3. මිල ගණන්

අදාල වී තොග කිලෝවක් රු. 60/- ක අවම මිලක් යටතේ මිලදී ගැනීමටත් ගල් වැලි ඉවත්කොට සකස් කල සහල් පැකට් කර සන්නාම (ලේබල්) සහිතව කිලෝවක් රු. 150/- ක උපරිමයකට යටත්ව සාමාන්‍ය පාරිභෝගිකයාට මිලදී ගැනීමට හැකි වන පරිදි වෙළඳපොල වෙත යැවීමටත් විධිවිධාන යෙදිය යුතුය. සුවදැල් සහ බෙහෙත් හීනැටි සහල් කිලෝවක මිල ඊට මදක් වැඩිවිය හැකිය.

මෙහිදී එක් එක් ව්‍යවසායකයෙකුට අදාල ව්‍යාපෘතිය සඳහා සරල ව්‍යාපෘති වාර්තාවක් සකස් කල යුතු වේ. එයට ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින් අදාල වසමේ දිවිනැගුම සංවර්ධන නිලධාරී, අදාල තාක්ෂණික/ ක්ෂේත්‍ර නිලධාරීන්, දිවිනැගුම ප්‍රජා මූල බැංකු කලමණාකරු, ව්‍යාපෘති කළමණාකරු , මූලස්ථාන කලමණාකරුවන්ගේ අදාල නිර්දේශ හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. අදාල ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුම්වත් කල යුතුය.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුග්‍රහයෙන් සහල් අලෙවි කිරීමට අවශ්‍ය ප්‍රචාරණය හා අලෙවි සම්බන්ධීකරණ කටයුතු පොදු දේශිය සහල් ප්රවර්ධන වැඩසටහනක් ලෙස ඉටුකිරීමටත්, සහල් පැකට් / මලු මත රාජ්‍ය ලාංඡනය සහිතව ***ධාර්මික සහල්*** යන වෙළඳ නාමය භාවිතා කිරීමට අවසර ලබාදීමටත් ඉදිරියේදී අවශ්‍යතාවය අනුව කටයුතු කිරීමට නියමිතයි.

### 3.4. කාල රාමුව

| ක්‍රියාකාරකම් | වගකීම | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| i. ව්‍යවසායකයින් හඳුනා ගැනීම. | බැංකු කළමණාකරු<br>ව්‍යාපෘති කළමණාකරු<br>මූලස්ථාන කළමණාකරු | √ | | | | | | | | |
| ii. ව්‍යාපෘති වාර්තා සකස් කර අනුමැතිය ලබා ගැනීම. | ව්‍යාපෘති කළමණාකරු<br>මූලස්ථාන කළමණාකරු | √ | | | | | | | | |
| iii. ණය ලබාදීම. | බැංකු කළමණාකරු | √ | | | | | | | | |
| iv. අවශ්‍ය තාක්ෂණික අලෙවිකරණ සහාය ලබා දීම. | මූලස්ථාන කළමණාකරු | √ | | | | | | | | |
| v. මිලදී ගැනීම, සැකසීම, අලෙවිය පිළිබඳ ප්‍රගතිය විමර්ෂණය කිරීම. | ප්‍රාදේශීය ලේකම් /<br>මූලස්ථාන කළමණාකරු<br>ව්‍යාපෘති කළමණාකරු | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| vi. ණය වාරික අය කිරීම. | බැංකු කළමණාකරු | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| vii. සමස්ථ වැඩසටහනේ ප්‍රගතිය වාර්තා කිරීම. | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |

## 4. මෙහෙයුම් හා ඇගයුම්

ප්‍රගතිය සතිපතා ග්‍රාමීය මට්ටමේදී, සති දෙකකට වරක් දිවිනැගුම බැංකු කලාප මට්ටමේදී, මසකට වරක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේදී විමර්ශණය කල යුතුය. මාසික ප්‍රගති වාර්තාව එළඹෙන මස 05 දිනට ප්‍රථම දිස්ත්‍රික් කාර්යාලය හරහා මා වෙත ලබාදිය යුතුය.

වස විස නැති දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉමහත් දායකත්වයක් දක්වන මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලය ලබාදෙන සහාය බෙහෙවින් අගය කරමි.

මෙම චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර උපදෙස්/ තොරතුරු දැනගැනීමට අවශ්‍ය වෙතොත් දුරකථන අංක 0112-873801 /0112-869824 ඔස්සේ මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන) අමතන්න.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය
   එස්.බී. දිසානායක මැතිතුමා, - කා.දැ.ගැ.පි.
2. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. ප්‍රාදේශීය ලේකම්, .................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ගැ.පි.
5. අධ්‍යක්ෂ (මුදල් / ක්ෂුද්‍ර මූල්‍ය/ අලෙවි/සැලසුම්/ ප්‍රජා මූල සංවිධාන),
   දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ,......................................... - කා.දැ.ගැ.පි.
8. ගොවිජන සේවා නියෝජ්‍ය / සහකාර කොමසාරිස්,........................ - කා.දැ.ගැ.පි.